**මහ කොළඹ ජල පුනරුත්ථාපන ව්‍යාපෘතිය - 2011**

**-------------------------------------------------------------**

1. මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව , සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2. මූල්‍ය ප්‍රකාශන

------------------

2.1.1 මූල්‍ය කාර්ය සාධනය

-------------------------

මූල්‍ය ප්‍රකාශනවලට සහ විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.1,311,682,460 ක් වූ අතර 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.2,136,595,943 ක් විය. සමාලෝචිත වර්ෂයේ වියදම, පෙර වර්ෂයේ වියදම සහ 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| අයිතමය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2011 | 2010 | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 952,669,759 | 367,997,436 | 1,323,215,282 |
| මෙහෙයුම් පිරිවැය | 213,738,637 | 82,733,476 | 415,914,376 |
| උපදේශක සේවා | 51,689,398 | 63,577,776 | 193,942,392 |
| එකතු කල අගය මත බදු (වැට්) | 93,584,666 | 94,602,987 | 203,523,893 |
| | 1,311,682,460 | 608,911,675 | 2,136,595,943 |

3. විගණන නිරීක්ෂණ

3.1 ගිණුම්කරන අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජා.ජ.ස.ජ.ම. හි කටයුතු සඳහා වූ ව්‍යාපෘති අරමුදලින් රු.3,487,816 ක් සහ රු.61,370 ක් පිළිවෙලින් දකුණු ඉවුරු ජල පෝෂක ප්‍රදේශය පුනරුත්ථාපනය හා ආදායම් නොවන ජල ව්‍යාපෘති වෙනුවෙන් වියදම් කර තිබුණි.

(ආ) සහතික කල ඉදිකිරීම් වැඩවලට සම්බන්ධ රු. 50,775,374 ක් 2011 දී ගිණුම් වලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල ව්‍යාපෘති වියදම සහ කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු වටිනාකම යන දෙකෙහිම සමාන ප්‍රමාණයකින් මෙම වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා ව්‍යාපෘතිය ඉඩම් කැබැල්ලක් අත්පත්කර ගෙන තිබුණු අතර වාරික වශයෙන් ගෙවීම් සිදුකිරීමට එකඟ වී තිබුණි. කෙසේ වෙතත් එකඟ වූ පරිදි එම ගෙවීම් සිදුකර නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2011 දී අමතර පිරිවැය රු.1,656,666 ක් දඩ වශයෙන් ව්‍යාපෘතිය විසින් දැරීමට සිදු වී තිබුණි.

(ඇ) එලි හවුස් ජල සංචිතය ඉදිකර ඇති භූමියේ තිබූ තදගල් තට්ටුව, මූලික අධ්‍යාන කටයුතු වලදී හඳුනා නොගැනීමේ හේතුවෙන් එය කැඩීම සඳහා රු.4,816,276 ක අමතර පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි.

4. මුල්‍ය හා භෞතික කාර්ය සාධනය

---------------------------------------

4.1 අරමුදල් උපයෝජනය

--------------------------

2011 දෙසැම්බර් 31 දිනට අරමුදල් ප්‍රතිපාදනය හා එහි උපයෝජනයට අදාළ වැදගත් සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| | **ණය ගිවිසුමේ ලබා දීමට එකඟ වී ඇති වටිනාකම** | | **2011 වර්ෂය සඳහා ප්‍රතිපාදනය** | **2011 වසර තුළදී අරමුදල් උපයෝජනය** | **2011 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය** | |
|---|---|---|---|---|---|---|
| | **ජපන් යෙන් (මිලියන)** | **රු. (මිලියන)** | **රු. (මිලියන)** | **රු. (මිලියන)** | **රු. (මිලියන)** | **%** |
| ජා.ස.ජ.නි. | 3,975 | 3,549 | 868 | 838 | 1,883 | 53 |
| ශ්‍රී.ලං.ර | 1,384 | 1,236 | 320 | 320 | 644 | 52 |
| එකතුව | 5,359 | 4,785 | 1,188 | 1,158 * | 2,527* | 53 |

* සමාලෝචිත වර්ෂයේ උපයෝජනය කළ අරමුදල් සහ 2011 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් සම්බන්ධයෙන් පිළිවෙලින් රු.මිලියන 153 ක සහ රු.මිලියන 391 ක ශුද්ධ කාරක ප්‍රාග්ධනය ඇතුළත් නොකිරීම හේතුවෙන් මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දක්වා ඇති වටිනාකම් මෙම වටිනාකම් වලින් වෙනස් වේ.

4.2 මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව අනුව, සමාලෝචිත වර්ෂය අවසන් දිනට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 66 ක් හා සියයට 49 ක් විය. ව්‍යාපෘතියෙහි ඒ ඒ සංරචකයේ සමුච්චිත කාර්ය සාධනය පහත දැක්වේ.

| **ව්‍යාපෘති ක්‍රියාකාරකම / සංරචකය** | **අවසන් කිරීමට නියමිත දිනය** | **2011 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය (%)** | |
|---|---|---|---|
| | | **මූල්‍ය** | **භෞතික** |
| (i) මාලිගාකන්ද කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරිම (ඩබ්ලිව්එස්ඩීපී/ජීසීඩබ්ලිව්ආර්පී/එන්සීබී/01) | 2011 මැයි 31 | 81 | 99 |
| (ii) මුල්ලේරියාව සහ කොටිකාවත්ත ප්‍රදේශවල ජලය බෙදාහැරීම (ඩබ්ලිව්එස්ඩීපී/ජීසීඩබ්ලිව්ආර්පී/එන්සීබී/02) | 2012 ජූලි 19 | 57 | 61 |
| (iii) එලිහවුස් ජල සංචිතය ප්‍රතිසංස්කරණය කිරිම, මාලිගාකන්ද නව ජල සංචිතය, ගොතටුව සම්ප්‍රේෂණ සහ ගොතටුව නව ජල කුළුන ඉදිකිරීම (ඩබ්ලිව්එස්ඩීපී/ජීසීඩබ්ලිව්ආර්පී/අයිසීබී/03) | 2012 නොවැම්බර් 25 | 39 | 48 |
| (iv) අඩු ආදායම් ජනාවාස ජල සැපයුම් වැඩි දියුණු කිරීම | 2012 ජනවාරි 01 | 18 | 62 |
| **සමස්ත ප්‍රගතිය** | | **49** | **66** |

(ආ) ව්‍යාපෘතියේ අඩු ආදායම් ජනාවාසවල ජල සැපයුම වැඩි දියුණු කිරීමේ සංරචකයෙන් ඉලක්ක ගත අඩු ආදායම් ජනාවාසවල නිවැසියන් 1,000 ක් හඳුනාගැනීම හා පුද්ගලික ජල සැපයුම ලබා දීම මෙන්ම ජල නාස්තිය සිදුවන ප්‍රදේශ හඳුනාගෙන එහි නාස්තීන් අඩු කර ගැනීමේ ක්‍රමවේද හඳුන්වාදීමේ ප්‍රගතිය 2011 දෙසැම්බර් 31 දිනට සියයට 62 ක තරම් අඩු මට්ටමක් පෙන්නුම් කෙරිනි. 2011 දෙසැම්බර් 31 දිනට අදාළ සංරචක වෙනුවෙන් දරන ලද රු.9,547,998 වූ මුළු වියදමෙන් සියයට 37 ක් කාර්යාල උපකරණ මිලදී ගැනීම හා කාර්යාල බෙදා වෙන්කිරීම සඳහා සිදුකර තිබුණි.

(ඇ) ගොතටුව-කොලොන්නාව සහ මුල්ලේරියාව ප්‍රදේශ වල ජලය සැපයීම හා නල එළීම සඳහා කොන්ත්‍රාත්තුව 2010 අප්‍රේල් 22 දින පිරිනමන ලද අතර 2012 ජූනි 30 දින අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත් කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණේ 2013 සැප්තැම්බර් දිනදීය.